## පළමුවන කියැවීම

ප්‍රඥා 11:22-12:2

සලමොන්ගේ ප්‍රඥාව පොතෙන් ගත් පාඨයෙකි.

**මිහි මත ඇති සියල්ලට ඔබ ප්‍රේම කරන සේක.**

ඔබ අබිමුව මුළු ලොව තරාදිය උස් පහත් කළ හැකි දූවිලි කුඩක් හා සමාන ය. පොළොවට වැටෙන උදය කාලයේ මීදුම් බිඳක් හා සමාන ය. එහෙත්, ඔබට සියල්ල කළ හැකි බැවින් ඔබ සියල්ලන් හට දයාන්විත ය. මිනිසුන් තම පව් ගැන මනස්තාප වන පිණිස ඔබ ඔවුන්ගේ පාප ගැන නොසැලෙන්නෙහි ය. එසේ ය, මිහි මත ඇති සියල්ලට ඔබ ප්‍රේම කරන සේක. ඔබ විසින් සාදන ලද කිසිවක් ඔබ පිළිකුල් නොකරන සේක. මන්ද, ඔබ යමකට ද්වේෂ කළ සේක් නම්, ඔබට එය නොසාදන්න ඉඩ තිබිණි. ඔබට අභිමත නොවූ සේක් නම්, යමක් පවතින්නේ කෙසේ ද? ඔබ නොසැඳූ සේක් නම්, යමක් ආරක්ෂා වන්නේ කෙසේ ද? සමිඳුනි, ජීවමාන සියල්ලට ප්‍රේම කරන්නාණෙනි, සියල්ල ඔබ සතු බැවින් ඔබ සියල්ල ම ආරක්ෂා කරන සේක. සියල්ල තුළ ඔබේ අමරණීය ආධ්‍යාත්මය විනිවිද යයි. සමිඳුනි, වරද කරන්නන් ඔබ ක්‍රම ක්‍රමයෙන් හරිගස්වන සේක. ඔබ කෙරෙහි විශ්වාසය තබා ඔවුන් නපුරෙන් ඈත් වනු පිණිස ඔවුන් වරද කළ සැටි ඔබ ඔවුන්ට පෙන්වා දී ඔවුන්ට අවවාද කරන සේක.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 145:1-2, 8-11, 13-14

පිළිතුර: මා දෙවි රජිඳුනි, ඔබ නම මම සදාකල් ම පසසමි.

ගීය: මා දෙවි රජිඳුනි, ඔබ ගුණගයමි. ඔබ නම සදාකල් ම පසසමි. සැම දා ඔබට තුති පුදමි; සදාකල් ඔබ නම පසසමි. සමිඳාණෝ දයාවන්ත ය. අනුකම්පාවෙන් පූර්ණ ය; වහා නොකිපෙන සුලු ය; තිරසර පෙමින් යුතු ය.

සමිඳාණෝ සියල්ලන්ට කරුණාව පාන සේක; එතුමන්ගේ සුමුදු දයාව මවන ලද සියල්ල ද වෙත පැතිරෙයි. සමිඳුනි, ඔබ මැවූ සියලු දේ ඔබට තුති පුදයි; ඔබේ සැදැහැවත්තු ද ඔබට ප්‍රශංසා කරති.

ඔව්හු ඔබේ රාජ්‍යයේ මහිමය වර්ණනා කරති. ඔබේ බල මහිමය ගැන ද කතා කරති. ඔබේ රාජ්‍යය සදාකාලික ය, ඔබේ ආධිපත්‍යය ද සියලු පරම්පරාවල ම පවත්නේ ය.

සමිඳාණෝ සියලු පොරොන්දු ඉටු කරන සේක. තමන් කරන සියල්ලේ දී මෙත් සිත් වඩන සේක. වැටෙන දුබලුන් හට සමිඳාණෝ ආධාර කරන සේක. නැමී සිටින සියල්ලන් කෙළින් සිටුවන සේක.

## දෙවන කියැවීම

2 තෙසලෝනික 1:11- 2:2

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද දෙවන හසුනෙන් ගත් කොටසකි.

**ක්‍රිස්තුස් වහන්සේගේ නාමය ඔබ අතරේ ගෞරවයට පැමිණේවා.**

අප ඔබ ගැන නිතර ම යාච්ඤා කරන්නේ ඒ නිසා ය. දෙවියන් වහන්සේගේ කැඳවීමට ඔබ සුදුස්සන් වන ලෙසත්, උන් වහන්සේගේ බලයෙන් යහපතට ඇති ඔබේ ආශා සියල්ල ඉටු කර, ඇදහිල්ලේ ක්‍රියාවන් සම්පූර්ණ කරන ලෙසත්, අපි යාච්ඤා කරමු. තවද අපගේ දෙවියන් වහන්සේගේ ද ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ද

වරප්‍රසාදය කරණකොටගෙන අපගේ ජේසුස් ස්වාමීන් වහන්සේගේ නාමය ඔබ අතර ගෞරවයට පැමිණෙන පිණිස ද, ඔබ උන් වහන්සේගෙන් ගෞරවය ලබන පිණිස ද, අපි යාච්ඤා කරමු. සහෝදරවරුනි, අප ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ආගමනය ගැන ද උන් වහන්සේ හමුවෙහි අප එක් රැස්වීම ගැන ද දන් අප කතා කළ යුතු ය. ස්වාමීන් වහන්සේගේ දවස දනට ම පැමිණ ඇතැ යි දක්වෙන දිවැස් වැකියකින් හෝ, ආරංචියකින් හෝ, අපෙන් යයි කියන හසුනකින් හෝ, පහසුවෙන් වියවුල් නොවන හැටියටත්, නොකැළඹෙන හැටියටත්, අපි ඔබගෙන් උදක් ම ඉල්ලමු.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** ලූක් 19:38, 2:14

ආලේලූයා! ආලේලූයා!
සමිඳාණන්ගේ නමින් වඩිනා රජුට ආසිරි වේවා!
අති උසස් තන්හි දෙවිඳුන්ට මහිමය ද, සාමය ද වේවා!
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ලූක් 19:1-10

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**මනුෂ්‍ය-පුත්‍රයාණෝ නැති වූ දේ සොයන්නට ද ගළවාගන්නට ද වැඩම කළ සේක.**

ජේසුස් වහන්සේ ජෙරිකෝවට පිවිස, ඒ මැදින් ගිය සේක. සාකෙවුස් නම් ධනවත් ප්‍රධාන අයකැමියෙක් එහි විය. ඔහු ජේසුස් වහන්සේ කවුරුන් ද යි බැලීමට සෙව් ය. එහෙත් ඔහු මිටි කෙනෙකු වූයෙන් සමූහයා නිසා එය කළ නොහැකි විය. ජේසුස් වහන්සේ ඒ පාරෙන් යන්න සිටි බැවින්, ඔහු පෙරටුව දුව ගොස්, උන් වහන්සේ දක්නා පිණිස අත්තික්කා ගසකට නැංගේ ය. ජේසුස් වහන්සේ ඒ ස්ථානයට පැමිණ, උඩ බලා, ඔහුට කතා කොට, "සාකෙවුස්, වහා ම බිමට බසින්න, අද මට ඔබේ ගෙදර නවාතැන් ගන්න ඕනෑ ය"යි ඔහුට වදාළ සේක. ඔහු වහා ම බැස, අවුත්, ප්‍රීතියෙන් උන් වහන්සේ පිළිගත්තේ ය. ඒ දුටු සියල්ලෝ, "උන් වහන්සේ පව්කාර මනුෂ්‍යයකු සමඟ නවාතැන් ගන්නට ගිය සේකැ"යි කියමින් කොඳුළෝ ය. සාකෙවුස් නැඟිට, "ස්වාමීනි, මා සන්තක දෙයින් දෙකෙන් කොටසක් දිළිඳුන්ට දෙමි, යමෙකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේ නම්, ඔහුට සතර ගුණයක් ආපසු දෙමි"යි ස්වාමීන් වහන්සේට කී ය. ජේසුස් වහන්සේ කතා කරමින්, "ගැළවීම අද මේ ගෙදරට පැමිණ ඇත; මොහු ආබ්‍රහම්ගේ පුත්‍රයෙකි. මනුෂ්‍ය-පුත්‍රයාණෝ නැති වූ දේ සොයන්නට ද ගළවාගන්නට ද වැඩම කළ සේකැ"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.